මාධ්‍ය නිවේදනය
චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02
දුර: +94 11 213 5400 / +94 11 213 5405
ඊ-මේල්: cgir@ird.gov.lk
ෆැක්ස්: :011 233 7777

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
INLAND REVENUE DEPARTMENT

දිනය : 2025 ජනවාරි 03

## දේශීය ආදායම් දෙපාර්තමේන්තු ඉතිහාසයේ වැඩිම බදු ආදායම රැස්කරයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තු ඉතිහාසයේ මෙතෙක් රැස් කරන ලද ඉහළම බදු ආදායම 2024 වර්ෂය වෙනුවෙන් රැස් කළ අතර, එය රුපියල් මිලියන **1,958,088** ක් වේ. මෙය 2023 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන **392,669** ක වැඩිවීමක් වන අතර, එහි වර්ධනය සියයට **25.1** කි.

**2024 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද මුළු බදු ආදායම පහත පරිදි වේ.**

| බදු වර්ගය | 2023 වසරේ ආදායම් රැස්කිරීම (රුපියල් මිලියන) | 2024 වසරේ ආදායම් රැස්කිරීම (රුපියල් මිලියන) |
|---|---|---|
| ආදායම් බදු | 911,097 | 1,023,207 |
| එකතු කළ අගය මත බද්ද | 469,107 | 714,684 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 164,915 | 187,042 |
| ඔට්ටු හා සූදු බද්ද | 7,422 | 14,923 |
| කොටස් ගනුදෙනු බද්ද | 2,478 | 3,128 |
| අනෙකුත් බදු | 360 | 271 |
| පළාත් සභා වෙත ප්‍රේෂණය කරන ලද මුදල | 10,040 | 14,833 |
| **එකතුව** | **1,565,419** | * **1,958,088** |

*දළ දත්ත

2023 වර්ෂයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද රුපියල් මිලියන **1,565,419** ක බදු ආදායම සමග සැසඳීමේ දී 2024 වසරේ දී බදු ආදායම රුපියල් මිලියන **1,958,088** ක් දක්වා වර්ධනය කර ගැනීම මගින් රාජ්‍ය මූල්‍ය තත්ත්වය ශක්තිමත්ව පවත්වා ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රශංසනීය දායකත්වයක් සපයා ඇත.

පවත්නා බදු නීතියට අනුගත වෙමින් රට වෙනුවෙන් හා රටේ පොදු මහජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් බදු ගෙවන ලද ගෞරවනීය බදු ගෙවන්නන්ටත් ඒ සඳහා විවිධාකාරයෙන් සහයෝගය ලබා දුන් රාජ්‍ය හා පුද්ගලික ආයතනවල නිලධාරීන්ටත් කෘතඥතාව පළ කරමි.

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.